නමෝ බුද්ධාය

විසි වෙනි වෙළුම
ආරම්භය: 2001-07-05

මාසික ධර්ම සංග්‍රහය අංක: 203

ශ්‍රී. බු. ව. 2561 | 2017 මැයි 10 | වෙසක් කළාපය

# සසර සැනසුම සදන තිදොර සංවරය

බළන්ගොඩ, තළුවෙල ශ්‍රී ප්‍රියදර්ශනාරාමාධිපති ධර්මරාජ පරිවේණාධිපති,
ගෞරව ශාස්ත්‍රවේදී

## අති පූජ්‍ය බළන්ගොඩ ජිනරතන නාහිමිපාණන් විසිනි

නමෝ තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස ///

**"තස්මා තිහ රාහුල පච්චවෙක්ඛිත්වා, පච්චවෙක්ඛිත්වා කාය කම්මං පරිසෝධෙස්සාම, වචී කම්මං පරිසෝධෙස්සාම මනෝ කම්මං පරිසෝධෙස්සාමාති. එවං හි වෝ රාහුල සික්ඛිතබ්බන්ති"** - මජ්ඣිම නිකාය -

මෙම ශ්‍රී මුඛ දේශනා පාඨය අපට දකින්ට ලැබෙන්නේ මජ්ඣිම නිකායේ අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍ර ධර්මයේය. එය මජ්ඣිම පණ්ණාසකයේ භික්ඛු වග්ගයට ඇතුළත් වෙයි. මෙහි සඳහන් වෙන්නේ රාහුල හිමියන්ට බුදුරජාණන් වහන්සේ කළ අවවාදයකි. කුමක් සඳහා කළ අවවාදයක් ද? පැවිද්දෙකු විසින් සිත කය, වචනය යන තිදොර සංවර කර ගන්නා පිළිවෙතයි.

එම ධර්ම මාර්ගය ආගම් භේදයකින් තොරව, ලොව වෙසෙන සියලු මනුෂ්‍ය වර්ගයාටම සංවරයට ඉතාම අගනේය. බෞද්ධ දර්ශනයේ පෙන්වා දෙන සීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිශික්ෂා පිළිවෙත් වලින් ද කෙරෙන්නේ එයයි.

පින්වතුනි, අප උපතේ සිට ජීවිතාන්තය තෙක් පිවත්වීම යන්නෙන් අදහස් කරන්නේ අපගේ තිදොර පුද්ගලයන් අතර හා සමාජය තුළ ක්‍රියාත්මක කිරීමය. එය පුද්ගලයන්ගෙන් සිදු වෙන්නේ අසංවරව නම් අදැහැමි හිංසාකාරී සිදුවීම් සිදුවෙයි.

ඒ සියල්ලට බුදු දහම "පාප" යන නාමය දෙයි. එසේ නොවේ නම් අනුන්ටත් තමන්ටත් සැනසිලි දායක නම් "පින්" යන නාමයෙන් හැඳින්වේ. එපමණක් නොවෙයි. හැදිච්චකම, ශීලාචාරකම, ශිෂ්ටාචාරය යන්නෙන් පැවසෙන්නේද මෙම තිදොරෙහි ඇති සංවරකමයි. ආගම් භේදයක් නොමැතිව කාට වුවද ලොව නිවැරදි සහනශීලී දිවි පෙවෙතක් ගත කිරීමට මෙම පිළිවෙත සුදුසු යැයි ප්‍රකාශ කරන ලද්දේ ඒ හෙයිනි.

බුද්ධ දේශනයට අනුව විමසිලිමත් තුන් දොරතුවෙහි සංවරය "මහණකම" නමින් හැඳින්වෙනවා. මේ අවවාදය බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද්දේ

රාහුල හිමියන්ටයි. උන් වහන්සේ වැඩිහිටියන්ට කීකරුවෙති. ගරු කරති.

නිතර පුදුමින් අවවාද අනුශාසනයන්ට ප්‍රිය කරති. ඒ නිසා උන්වහන්සේ අන්‍ය භික්ෂූන් අතර සුවච කීකරු යැයි ප්‍රසිද්ධ වූහ. මේ ගුණ දහම පොදු කාට වුවද දියුණුවෙහි හිණිමගකි.

මෙම ධර්ම දේශනය කෙළේ බුදුරජාණන් වහන්සේ රජගහනුවර වෙළුවනාරාමයෙහි වැඩ වෙසෙන සමයකදිය.

රාහුල හිමියෝ "අම්බලට්ඨික" නමින් ප්‍රසිද්ධව තිබුණු ප්‍රාසාදයක වැඩ සිටියහ. උන් වහ්නසේ මුල් කොට ලොව මනුෂ්‍ය වර්ගයාට දහමක් දෙසීමට බුදුරජාණන් වහන්සේ ඉටා ගත්හ.

මේ අදහසින් උන්වහන්සේගේ එක් සන්ධ්‍යා සමයක අම්බලට්ඨික ප්‍රාසාදයෙහි වැඩ වෙසෙන රාහුල හිමියන් කරා වැඩම කළහ.

එවෙලෙහි රාහුල හිමියන් ඉතා සතුටු පහටුව වැඩ නමස්කාරයෙන් බුදුරජාණන් වහන්සේ පිළිගත්හ. ඒ සමඟ ශ්‍රී පා දොවා මුව දෝවනයට පැන් බඳුනක් ද පිළිගැන්වූහ.

එය අතට ගත් බුදුරජාණන් වහන්සේ ඒ ඇසුරු කර දහමක් දෙසීමට ආරම්භ කළහ.
එම දහම් පිළිවෙත සිල්වත් පැවිදි ජීවිතය මුල් කර ගෙනය. ඒ අනුව සීලාදී ගුණයන් ගෙන් සමන්විත පැවිදි ජීවිතය ඉතා ගුණ සම්පන්නය.

පිරුණු දිය බඳුනක් සේ සම්පූර්ණය. එසේ අවධාරණය වන පරිදි පැන් බඳුනේ දිය මඳක් ඉතිරි කර මෙසේ වදාළහ.

"රාහුල මේ බලන්න."
මෙම බොරු කියන පැවිද්දාගේ ජීවිතය ද හිස්ය. ඉතිරිව ඇති ජලය මෙන් ගුණ දහම් මඳය. ඒ සමගම පැන් බඳුන යටිකුරු කර සීලයක් ගුණයක් නොමැති ජීවිතයක් මෙසේ යැයි විස්තර කර දුන්හ.

පින්වතුනි, මෙම අවවාදය දෙසීම දී මුසාවාදය හෙවත් බොරුව අවධාරණය කෙළේ කවර හෙයින්ද? බොරුවෙන් වෙසෙන පැවිදිකම හිස් බව පෙන්වීමට මෙසේ දේශනා කොට තිබේ. බුදු සසුනේ සට කපට කමින් යුතු පැවිදි කමක් නැත. එසේ යමෙක් ජීවත් වෙත් නම් හේ පාපියෙකි.

නිසරු වූ දෙලොවම පරාජිත වන දිවි පැවැත්මක් වෙයි. බුදු වදනට අනුව එම ජීවිතය ලොවට ණය වූවකි. එසේම සැදැහැවතුන්ගේ සිවුපස ලාභය සොරා කෑමකි. වර්තමානයේ ආචාර්ය පරම්පරාවක් නැති හොරට සිවුරු පෙරවා ගෙන ජීවනෝපායට ගමක් නගරයක් පාසා සම්මාදම් කරන අය නැත්තේ නොවේ.

ඔවුන් පොට්ටනිකාරයන් නමින් හැඳින්වෙයි. ඔවුන්ගෙන් ප්‍රියශීලී භික්ෂූන්ටත් [illegible] නියම පැවිද්දා කව්රුන්දැයි

තේරුම් ගත යුතුව ඇත.

සිල්වත් මහණ තෙම තම ජීවිතය මහාසේ රක්‍ෂා කරගෙන අනුනටත් ලෝකයටත් යහපත සලසා දෙයි. සැදැහැවතුන්ගේ පින් නමැති බිජු වපුරන කෙතක් සේ (පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං ලෝකස්සාති") වැඩ වෙසෙයි. එය නියම පැවිදිකම මෙන්ම නිර්වාණාවබෝධය සඳහා පිළිවෙත් පිරීමකි.

මෙවන් නිවැරදි පැවිදිකමක් අවධාරණයෙහිලා රාහුල හිමියන්ට විස්තර කර දුන් බව දැන් අපට වැටහෙයි.

සම්බුද්ධ ශාසනයට ඇතුළුව පැවිදිකම කරන්නා එය අව්‍යාජව, අවංකව, ජීවිත පරිත්‍යාගයෙන් කළ යුතුමය. සුළු වරදෙහි පවා බිය දකිමින් සංවරව සීලය සම්පූර්ණ කළ යුතු බව බුද්ධ මතයයි.

මෙකී අවංක භාවය පෙන්වාදීමට, යුද වදින රජෙකුගේ ඇතුන් දෙදෙනෙක් උදාහරණයට පෙන්වා දී තිබේ. එක් ඇතෙක් රණ බිමෙහි යුද්ධ කරතත් ඔහු රජුට ජීවිත පරිත්‍යාගයක් නොකරයි. ඒ අනුව උගේ ශක්තිය වන සොඬ එකුළුවා ගෙන ආත්මාර්ථය අරබයා සටනෙහි නිරත වෙයි. අනෙකා එසේ නොවේ.

සොඬ ද සම්පූර්ණයෙන්ම යොදා සටන් කරයි. මෙලෙස වංක පැවිද්දා ජීවිත පරිත්‍යාගයක් නැතිව ව්‍යාජ ලෙස වාසය කරයි. එය මහණකමක් නොව වෙස් මාරු කරගෙන වාසය කිරීමකි. ප්‍රතිපත්ති ගරුක සිල්වත් පැවිද්දා මහණකම හොඳින් රකී. සුළු වූ ශික්ෂා පදය වුවද කැඩීමට බිය වේ. එයින් සියලු කෙලෙස් කසට පිරිසිදු කොට නිර්වාණාවබෝධය ලබයි.

මීළඟට රාහුල හිමියන්ට තේරුම් කර දෙන්නේ තුන් දොර විමසමින් රැක ගන්නා සැටිය. ඒ සඳහා මුහුණ බලන කණ්ඩාඩියක් උදාහරණයට ගෙන තිබේ. එය ශරීරයේ සහ මුහුණෙහි අඩු පාඩු බලා සකසා ගැනීමට උපකාර වෙයි. එමෙන්ම මනසින් විමර්ශණාත්මකව තිදොරින් සිදුවන වැරදි දෙස බලන මෙන් පහදා දෙති. එසේ බැලීමේදී තමන්ටත් අනුන්ටත් විපතක් හිරිහැරයක් වේ නම් ඒ සියල්ල නොකර හික්මෙන්නැයි වදාළහ. මෙම පිළිවෙත බුදු දහමෙහි පෙන්වා දෙන විමංසාවයි.

විමංසාව නම් ඇතිවෙන පවතින දෑ පිළිබඳ විමසිලිමත් වීමයි. මෙම පිළිවෙත බුදු දහමට පමණක් විශේෂ වූවකි. මෙසේ තිදොර සංවර කර බුදුරජාණන් වහන්සේ යට සඳහන් කළ පරිදි රාහුල හිමියන්ට දෙසූහ. එනම්

"රාහුල, සිත කය, වචනය යන තිදොරින් සිදුවන දෑයින් තමන්ට අනුනට හිරිහැරයක් දුකක් පසුතැවිල්ලක් වේ නම් ඒවා නොකර හික්මෙන්න සංවර වෙන්න යනුවෙනි. මෙම දහම් මග රාහුල හිමියන් අරබයා දේශනය කර ඇතත් නිවැරදි පසුතැවිලි නොවන නිදොස් දිවියක් ගෙවීමට අපේක්ෂා කරන කාට වුවද එය සාධාරණ වෙයි.

පින්වතුනි, අප දැන් තිදොරින් සිදුවන අකුසල කර්ම මොනවාදැයි තෝරා ගත යතව ඇත. පෘතග්ජන වූ අපට නොයෙක් දෑ සිතන්නට කරන්නට කථා කරන්නට

ඒ සියල්ල අගක් මුලක් නැතිව කිරීමෙන් නොයෙක් විපත් ගිරිහැර ඇතිවේ. එසේම අපගේ තත්ත්වය, හැඩියාව ලොවට සමාජයට හෙළි වෙන්නේය. එසේ වීමෙන් කවර ලෙසකින් වත් ඒවා නැවත සකසා ගත නොහැකිය. අපගේ බුදුරජාණන් වහන්සේ "විමසා බලමින් නුවණින් වැඩ කරන්න යැයි ද වදාළේ එහෙයිනි.

මෙසේ අපරීක්ෂාකාරී කමින් සිදුවන කායික වැරදි තුනක් බුදුරජාණන් වහන්සේ වදාළහ. ඒවා නම් සතුන් මැරීම, සොරකම් කිරීම, කාමයෙහි වරදවා හැසිරීම යන පාප කර්මයි. මේවා කායික දුශ්චරිත හෙවත් අකුසල කර්ම නාමයෙන් හැඳින්වෙයි.

වචනයේ අසංවර කමින් බොරුකීම, කේලාම් කීම, පරුෂ වචන කීම, හිස් වචන කීම, යන සතරාකාර අකුසල කර්ම සිදුවෙයි. මනසින් (සිතින්) දැඩි ලෝභය, වෛරය, මිත්‍යා දෘෂ්ඨිය යන අකුසල කර්ම ඇතිවේ. මෙහිදී මිසදිටුව පිළිබඳ විස්තරයක් කළ යුතුව ඇත. මෙය ඇති තැනැත්තා සීලාදී ගුණ ධර්ම වලට නිග්‍රහ කරමින් මෙලොවක් පරලොවක් නැතැයි යන දෘෂ්ටියෙන් පසු වෙයි.

දෙමවුපියන් වැඩිහිටියන් නොපිළිගෙන ජීවිතය ගෙවයි. මෙම දෘෂ්ටිය ඇතිව විසීම මහා පාපකර්මයක් යැයි බුදුරජාණන් වහන්සේ වදාළහ.

පින්වතුනි, අප විසින් ලබාගෙන ඇත්තේ දුර්ලභ වූ මිනිස් ජීවිතයකි. එය පෙර කරන ලද කුසල කර්ම විපාකයකි. කරුණ කාට වුවද බෞද්ධ දර්ශනය අනුව මුසාවකැයි පැවසිය නොහැකිය. එහෙයින් අපගේ දිවි පැවැත්ම පිරිසිදුව පවත්වා ගත යුතුය.

දස අකුසල කර්මයන් ගෙන් බැහැරව දස කුසල ධර්ම උපදවා ගත යුතුය. එයට අම්බලට්ඨික දහමේ එන විමංසාකාරී ධර්ම න්‍යාය ඉතා අගනේය. ඒ අනුව කටයුතු කරමින් දොලොව දියුණු කර ගෙන සසර දුක් ඉවත් කර නිර්වාණ සුවය ලබමු.

**ඔබ සැමට සම්මා සම්බුදු සරණයි !**